මාධ්‍ය නිවේදනය

2018 අගෝස්තු 07, කොළඹදී...

Nestlé
Good Food, Good Life

# පූර්ණ යොදය සහිත රසවත් හා කැල්සියම් අනූන, NESTLÉ a+™ කිරි දේශීය වෙළෙඳපොළට හඳුන්වාදෙයි

දිනෙන් දින වර්ධනය වන දියර කිරි ඉල්ලුම සපුරාලමින් විසිදහසක පමණ ශ්‍රී ලාංකික කිරි ගොවීන්ගෙන් ලබාගත් උසස් ප්‍රමිතියෙන් යුත් දේශීය නැවුම් කිරිවලින් නිෂ්පාදිතයි.

නෙස්ලේ සමාගම, විසිදහසක පමණ ශ්‍රී ලාංකික කිරි ගොවීන්ගෙන් ලබාගත් උසස්ම තත්ත්වයේ දේශීය නැවුම් කිරිවලින් නිෂ්පාදනය කළ පූර්ණ යොදය සහිත හා රසයෙන් අනූන NESTLÉ a+™ කිරි නිෂ්පාදනය පසුගියදා මෙරට පාරිභෝගිකයන් වෙත හඳුන්වාදුනි. වසර 150කට වැඩි කාලයක් කිරි නිෂ්පාදනයෙහිලා ජාත්‍යන්තර අත්දැකීම් සහිත නෙස්ලේ සමාගම ඉදිරිපත් කරන මෙම නවතම නිෂ්පාදනය පෝෂ්‍ය ගුණයෙන් ද පූර්ණ යොදය නිසා ඉහළ රසයකින් ද භාවිතා කිරීමේ පහසුවෙන් ද යුතුව වෙළෙඳපොළට නිකුත් කරතිබීම විශේෂත්වයකි. එමෙන්ම NESTLÉ a+™ මිලදී ගැනීමෙන් මෙරට දියර කිරි භාවිතය වර්ධනය කිරීමටත්, දේශීය කිරිගොවීන්ගේ ජීවිකාව සඳහා දායකත්වය දැක්වීමටත් පාරිභෝගිකයන්ට අවස්ථාව සැලසේ.

මේ පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ උප සභාපති (කිරි ආහාර) රුවන් වැලිකල මහතා මෙසේ පැවසීය. "නෙස්ලේ සමාගම කිරි ආහාර නිෂ්පාදනය ආරම්භ කළේ මීට වසර 150කට පෙරාතුවයි. අද දවසේ එම කිරි ආහාර සැකසීමේ නෙස්ලේ ප්‍රවීණත්වයේ ප්‍රතිලාභ අපි භුක්ති විඳිනවා. යම් නිෂ්පාදනයක නෙස්ලේ සන්නාමය තිබීමෙන්ම එහි ගුණාත්මකභාවය පිළිබඳ අවබෝධයක් අපට ලබාදෙනවා. ඊට බලපාන ප්‍රධාන හේතුව තමයි, එදා පටන්ම අපගේ කිරි නිෂ්පාදනවල උසස්බව සහතික කර තිබීම. අපි කිරි ගොවි මහතුන්වත් උසස් කිරි නිෂ්පාදනය කිරීමට පුහුණු කර තිබෙනවා. ඒ වගේම කිරි එකතුකිරීමේ ක්‍රියාවලියේත් සෑම පියවරකදීම උසස් ප්‍රමිතිය ආරක්ෂා කෙරෙනවා. ඒ නිසාම පාරිභෝගිකයා අතට පත්වන්නේ හොඳම නිෂ්පාදනයක් වීමට අපි සෑමවිටම වගබලාගෙන තිබෙනවා. මේ වන විටත් අපගේ පාරිභෝගිකයින් නෙස්ලේ හරහා ජාත්‍යන්තර මට්ටමේ කිරි ආහාර රසවිඳිනවා. දේශීය කිරිවලින් නිමැවූ අන්තර්ජාතික තලයේ නිෂ්පාදනයක් ලෙස මේ නවතම නිෂ්පාදනයත් අපි අභිමානයෙන් යුතුව පාරිභෝගිකයන්ට පිළිගන්වනවා".

කිරි යනු ස්වභාවිකවම කැල්සියම් සහ වෙනත් වැදගත් පෝෂ්‍ය කොටස්වලින් පිරිපුන් ආහාරයක් ලෙස සැලකේ. ශක්තිමත් අස්ථි පද්ධතියක් මෙන්ම නීරෝගී සමක් සහ දත් පෙළක් පවත්වාගෙන යාම සඳහා කැල්සියම් උපකාරීවන අතර කැල්සියම් අඩංගු සෙසු ආහාරවලට වඩා කිරි පානයට දරුවන් ප්‍රියතාවයන් දක්වන හෙයින් එය දෙමාපියන්ගේ ද ප්‍රමුඛ තේරීමක් බවට පත්ව තිබේ. විශේෂයෙන්ම වැඩිහිටිබවට පත් වීමෙන් පසුව කිරි පානයේ ප්‍රයෝජන හොඳින් ලැබිය හැකි නිසාම දියර කිරි සඳහා වැඩි ඉල්ලුමක් නිර්මාණය වෙමින් පවතී. දියර කිරි භාවිත කිරීමේ පහසුව ද ශ්‍රී ලංකා රජය විසින් දියර කිරි භාවිතය දිරි ගැන්වීම නිසා ද (විශේෂයෙන්ම ළමුන් අතර) එසේ වැඩි ඉල්ලුමක් නිර්මාණය වෙමින් තිබේ.

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය තවමත් අඩු කිරි සැපයුමක් සහිත වර්ධනය වෙමින් පවතින්නකි. කෙසේ වුවද වසර 30කට අධික කාලයක් තිස්සේ දේශීය කිරි ගොවීන් හා සම්බන්ධ වෙමින් තම නිෂ්පාදන සඳහා උසස් තත්ත්වයේ කිරි ලබාගනිමින් දේශීය කිරි කර්මාන්තය නගාසිටුවීමට ද නෙස්ලේ වෙතින් විශාල දායකත්වයක් ලැබී තිබේ. නෙස්ප්‍රේ Fortigrow පූර්ණ යොදය සහිත කිරි පිටි, මයිලෝ පානය, මිල්ක්මේඩ්, නෙස්ප්‍රේ Nutri-Up, නෙස්ප්‍රේ Coco-Up, නෙස්ප්‍රේ Fortigrow Milky Biscuit, නෙස්ටමෝල්ට් පානය, නෙස්කැෆේ පානය හා අලුතින් හඳුන්වාදෙන NESTLÉ a+™ පානය එවැනි නෙස්ලේ නිෂ්පාදන අතර වේ.

මේ පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය මෙසේ පැවසුවාය. "අපගේ ව්‍යාපාරය සමඟ දේශීය ප්‍රජාවත් නගා සිටුවීම අපගේ ප්‍රමුඛ අරමුණකි. ඒ හරහා පාරිභෝගිකයන්ට මෙන්ම සමස්ත සමාජයටම අගය එකතු කළ හැකියි. එවැනි පසුබිමකදී පාරිභෝගිකයන්ගේ පෝෂණ අවශ්‍යතා මෙන්ම ශ්‍රී ලාංකික කිරි ගොවීන්ගේ ජීවිකාවට අත්වැලක් සපයන තවත් අලුත් නිෂ්පාදනයක් හඳුන්වාදීමට හැකිවීම පිළිබඳ අපි නිහතමානීව ආඩම්බර වෙනවා. NESTLÉ a+™ නව නිෂ්පාදනය හරහාත් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින් නීරෝගීමත් අනාගතයක් වෙනුවෙන් අපේ කැපවීම පිළිබිඹු වෙනවා".

දේශීය වශයෙන් උසස් තත්ත්වයේ කිරි ලබාගැනීම වැඩිකරගැනීමේ අරමුණින් නෙස්ලේ සමාගම, ශ්‍රී ලංකා රජය සහ දේශීය කිරි ගොවීන් හා එක්ව තම කිරි දිස්ත්‍රික්ක ආකෘතිය ආරම්භ කළේ අසූව දශකයේදී ය. වර්තමානය වන විට දේශීය කිරි ගොවීන් විසි දහසකට පමණ නිරන්තර පුහුණු වැඩසටහන්, තාක්ෂණික සහ ක්ෂුද්‍ර මූල්‍ය සේවා සහාය, ජංගම පශු වෛද්‍ය සායන, කිරි රැස් කිරීමේ මෙවලම් සහ වෙනත් සම්පත් රාශියක් ද නෙස්ලේ සමාගම තිළිණකොට තිබේ. එමෙන්ම කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන, ශීතාගාර මධ්‍යස්ථාන (කිරිවල නැවුම්බව ආරක්ෂා කරගැනීම සඳහා) ආදී අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වෙනුවෙන් ද දැවැන්ත ලෙස ආයෝජනය කරමින් කිරි ගොවීන්ට අඛණ්ඩ වෙළෙඳපොළක් ආරක්ෂා කරදීමට නෙස්ලේ පියවර රැසක් ගෙන තිබේ. එබැවින් නෙස්ලේ සමාගමේ මෙරට කාර්යභාරය හරහා දේශීය පාරිභෝගිකයන්ට උසස් තත්ත්වයේ පෝෂ්‍ය ගුණයෙන් පිරුණු දේශීය කිරි නිෂ්පාදනයක් පිරිනැමීමට අමතරව, දේශීය කිරි ගොවීන්ට තම ව්‍යාපාරික අවස්ථාවන් වර්ධනය කරගනිමින් පවුලේ ආර්ථික වෘද්ධිය ඇතිකරගැනීම සඳහා ද පුළුල් අත්වැලක් සපයා දී ඇත.